


勞工處
Labour Department

1/2019

## ඔබගේ රැකිය ඒජන්සි ආයාතනයන් සැලිකිලිමත්ව තෝරගත යුතුයි

# රැකියා උගුල් වලින් ප්රවේසම් විය යුතුයි




勞工處
Labour Department

Sinhala Version 斯里蘭卡文版本

**විදේශීය ගෘහ සේවකයන් හොං කොං හි රැකියා ඒජන්සි සේවාවන් ලබාගනු ලබන්නෙ නම්, ඔවුන්ගෙ අයිති වාසිකම් රැකගැනීම සඳහා පහත දැක්වෙන දෙයන් දැනගත යුතුවේ.**



# රැකියා ඒජන්සියක (EA) සේවාවක් යොදවා ගන්නා විට




බලපත්‍රලත් රැකියා සේවාවන් සපයන රැකියා ඒජන්සි මගින් පමනක් සේවාවන් ලබාගත යුතුයි. අන්තර්ජාලය මගින් රැකියා ඒජන්සි වසල් රාමුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව මගින් වලංගු බලපත්‍ර නිකුත්කර තිබෙන රැකියා ඒජන්සි ලැයිස්තුව පරීක්ෂාකර සිටින්න (www.eaa.labour.gov.hk).

රැකියා ඒජන්සි පිළිපැදිය යුතු, කම්කරු දෙපාර්තමේන්තුව විසින් පනවන ලද නීති සංග්‍රහයක් තිබේ. එහි, රැකිය ඒජන්සි විසින් කලයුතු සහ නොකලයුතු දෙයන් පිළිබඳව පනවන ලද නීති සංග්‍රහය වෙත යොමුකර සිටින්න. මෙම නීති සංග්‍රහය රැකියා ඒජන්සි වසල් රාමුව තුලද පෙන්නුම් කෙරෙ.




විශේෂයෙන් විදේශීය රටවල, රැකියා ඒජන්සි මගින් ඉදිරිපත් කරන ලද රැකියා ඇබෑර්තු පිලිබඳ අව්‍යාජබව (සත්‍යය බාවය) පරීක්ෂාකර සිටිය යුතුයි. යම්කිසි සැකයක් මතුවන්නේ නම්, කරුනාකර ඔබගෙ තනාතිපති කාර්යාලයෙන් හෝ එම දෙශයන් හී තනාතිපති කාර්යාල වලින් විපරම්කර සිටින්න.




ඔබගේ සම්මත රැකියා කොන්ත්‍රාත්තුවෙහි ව්‍යාජ තොරතුරු සැපයීමෙන් වලකින්න (උදා: ඔබගේ වේතන, රැකිය ස්ථානයේ ලිපිනය යනාදිය.). එසේ කිරීමෙන් සමහරවිට ඔබට වරදකට මුහුන පෑමට හැකිවනු ඇත. ඔබ විසින් අත්සන් කරන ලද ඔබගේ සම්මත රැකියා කොන්ත්‍රාත්තුවේ මුල් පිටපත ඔබ සතුව තබාගත යුතුයි.




ඔබට සම්පුර්නයෙන් වටහාගත නොහැකි හෝ එකඟ නොවන කිසිදු ලේඛණයකට, ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට යනාදියට., අත්සන් නොතැබිය යුතුයි.



හොංකොං හී සේවයේ යෙදීමේදී, ඔබගෙ අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිලිබදව ප්‍රයෝජනවත් තොරතුරු දැනගැනීම සඳහා විදේශීය ගෘහ සේවක වසල් රාමුවට (www.fdh.labour.gov.hk) යොමුකර විමසා සිටින්න.



# රැකියා ඒජන්සි විසින් අයකරුැ ලබන ගාස්තූන්



නීතිය යටතේ, හොං කොං රැකියා ඒජන්සි වලට ඔබගෙන් කොමිස් වශයෙන් අයකිරීමට අවසර ඇත්තේ ඔබගේ පලමු මස වෙතනයෙන් උපරිම 10% ක් පමණි (උදා: නිර්දෙශ කරන ලද කොමිස්). මෙම ගෙවීම කල යුතු වන්නෙ, ඔබගේ පලමු මස වෙතනය ලැබීමෙන් පසුව වන අතර, ඊට පෙර නොවේ.




නිර්දෙශ කරන ලද කොමිස් හැර, රැකිය ඒජන්සිය විසින් කුමන අවස්ථාවකදී වුවද, ඔබගෙන් කිසිදු ගාස්තුවක් හෝ වියදමක් ඔබගේ රැකියාව ලබාදීම සම්බන්දයෙන් කුමන ආකාරයකින් වුවද අයකරගත නොයුතුයි.




රැකිය ඒජන්සියට කරනු ලබන කිසියම් ගෙවීමක් සම්බන්දයෙන් වුවද, සැම විටම කුවිතාන්සියක් ඉල්ල සිටිය යුත්යි. ඔබට රැකිය ඒජන්සි කොම්පනියේ ගිනුමට ගෙවීම් බැරකල හැකි නම්, ඔබට විසින් කරන ලද ගෙවීම් වාර්තාවක් තබාගත හැක. පෞද්ගලික ගිනුමකට හෝ රැකිය ඒජන්සියේ සේවකයෙකු වෙත මුදල් බැර කිරීමක් කර සිටීමෙන් වැළකී සිටින්න. ඔබ වෙත කිසිදු කුවිතාන්සියක් නිකුත් කිරීමට ප්‍රතික්ෂේප කර සිටී නම්, රැකියා ඒජන්සිය වෙත ගෙවීමක් නොකල යුතුයි.




රැකියා ඒජන්සියක් විසින් ඉල්ලාසිටි නම් හෝ යෝජනා කර සිටිය වුවද, රැකිය ඒජන්සි ගාස්තූන් ගෙවීම් කිරීමට කිසිදු මූල්‍ය සේවා ආයතන වලින් මුදල් නයට ලබා නොගත යුතුයි.

# දැනගතයුතු වෙනත් කරුණු



ඔබට අවසර ඇත්තේ ඔබගේ සේවා යෝජකගේ ගෘහ සේවාවන් කිරීමට වන අතර සහ සම්මත රැකිය කොන්ත්‍රාත්තුවේ සදහන් සේවා යෝජකයාගේ ලිපිනයෙහි සේවයේ යෙදීමට පමනයි. සම්මත රැකිය කොන්ත්‍රාත්තුවේ සදහන් සේවා යෝජකයාගෙ ලිපිනයේ හැර, ඔබට වෙනයම් අයෙකුට (ඔබගේ සේවා යොජකය ඇතුලුව),සේවා යෝජකයාගෙ හෝ රැකිය ඒජන්සියේ අවසරය හෝ ඉල්ලීම මත වුවද, වෙනයම් ස්ථානයක ඔබට සේවයේ යෙදිය නොහැක.




ඔබගේ අවසරය නොමැතිව කිසිවෙකුට, එනම්, රැකියා ඒජන්සියට හෝ සේවා යෝජකයට, ඔබගෙ ගමන් බලපත්රය, හොංකොං හැදුනුම්පත, සම්මත රැකිය කොන්ත්‍රාත්තුව ඇතුලු කිසිදු පෞද්ගලික දෙපලක් යනාදී., ඔවුන් සතුව හෝ තබා ගැනීමක් කල නොහැක.

# ඔබගේ අයිතිවාසිකම් උල්ලංගනයකර විටකදී

රැකියා ඒජන්සියෙන් හෝ රැකියා ඒජන්ත විසින් ඔබගෙන් නොහොමනා ප්‍රමාණයක අයකර ගැනීමක්ද, වලංගු බලපත්රයක් රහිතව ක්‍රියා කරසිටින බවට සැකයක් ඔබට පහල වන්නෙ නම්, කාර්යාල සේවා කාලය තුල කම්කරු දෙපාර්තමේන්තුවට අංක 2115 3667 දුරකථන මගින් හෝ විද්යුත් තැපෑලෙන් ea-ee@labour.gov.hk වෙත දැනුවත්කර සිටින්න. මෙම වරද වහාම කම්කරු දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කර සිටින්න.



රැකියාව සම්බන්ධයෙන් විමසීම් හෝ පැමිණිලි තිබේ නම්, ඔබට දුරකථන අංක 2157 9537 ට ඇමතිමක් කල හැක. (ක්ශනික සන්නිවේදන හැසුරුවීම් අංකය "1823").

ඔබ දුෂණයට හෝ ප්‍රචණ්ඩකාරී තත්වයකට මුහුනපා සිටිනම් හෝ ඔබගෙ ආරක්ෂාවට අන්ත්රාවක් නම්, පොලිසියේ හදිසි සේවාවට **999** අමතා ක්ෂණිකව දැනුවත්කර සිටින්න.







හොංකොං වලින් පිට නීති විරෝදි ලෙස ඔබව සේවයේ යොදවා ඇත්නම්, ආගමන දෙපාර්තමේන්තුවේ දුරකථන අංක 2824 6111 අමතා දැනුවත්කර සිටින්න.

